[සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
[All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2013

# පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2013 අගෝස්තු

# I පත්‍රය

මිනිත්තු 45 යි.

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

- ※ ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- ※ **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- ※ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **තුන** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- ※ කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.


**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කේත අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි | V/I/S |
| දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි | V/I/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි | V/I/S/EMF |
| ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි අවසාන ලකුණ නිවැරදිය | V/I/S/CH |


[2 වැනි පිටුව බලන්න

- මුලින් දී ඇති රූපවල අඩු කොටසට ගැළපෙන පිළිතුර තෝරන්න.

1. 




(1) (2) (3)

2. 



(1) (2) (3)

- පහත දැක්වෙන රූප සටහන බලා ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.




3. රූප සටහන අනුව හාවකු සිටිය හැකි ස්ථාන **දෙකක්** වන්නේ,
(1) 2 සහ 4 ය. (2) 3 සහ 5 ය. (3) 1 සහ 2 ය.


4. කුරුල්ලකු සිටිය හැකි ස්ථානයක් හා මාළුවකු සිටිය **නොහැකි** ස්ථානයක් පිළිවෙළින් දක්වෙන්නේ,
(1) 1 සහ 4 ය. (2) 3 සහ 6 ය. (3) 2 සහ 5 ය.

- දී ඇති රූපවලින් දෙකක් සමාන ය. එම රූප **දෙක** මොනවා ද?

5. 

A B C

(1) A සහ B ය.
(2) B සහ C ය.
(3) A සහ C ය.

6. 

X Y Z

(1) X සහ Y ය.
(2) X සහ Z ය.
(3) Y සහ Z ය.

[3 වැනි පිටුව බලන්න

විභාග අංකය ..............................

- රටාව හඳුනාගෙන හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

7.  ..............


(1)


(2)


(3)

8. ∈ β Ω ∈ β ...... ∈ ...... Ω

β Ω (1) Ω β (2) Ω ∈ (3)

- පහත දී ඇති සංඛ්‍යාවල රටාවක් ඇතිවීම සඳහා ඉවත් කළ යුතු සංඛ්‍යා මොනවා ද?

9. 8, 10, 11, 12, 14, 16

(1) 11 (2) 10 (3) 8

10. 30, 22, 25, 20, 18, 15, 10

(1) 22 සහ 15 (2) 22 සහ 18 (3) 25 සහ 18

- දී ඇති දෑ අතුරෙන් **තුනක්** එක් කාණ්ඩයකටත් **දෙකක්** තවත් කාණ්ඩයකටත් වන සේ ඒවා කාණ්ඩ කළ හැකි ය. **දෙකක්** ඇති කාණ්ඩයට අයත් වන්නේ මොනවා ද?

11. පත්තරය, පාසල, සඟරාව, පුස්තකාලය, පොත

(1) පාසල හා පොත (2) පොත හා පුස්තකාලය (3) පුස්තකාලය හා පාසල

12. අඹ, කැවුම්, අන්නාසි, කිරිබත්, කෙසෙල්

(1) කිරිබත් හා කෙසෙල් (2) කෙසෙල් හා කැවුම් (3) කැවුම් හා කිරිබත්

- කවිය කියවා ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.

දක්කම හරි ආස හිනෙන
ඇස් නටවන හිස සොලවන
අම්මා පොළෙන් ගෙනත් දුන්න
බෝනික්කා හරි ලස්සන

13. බෝනික්කා ගෙනත් දුන්නේ කවු ද? කොහෙන් ද?

(1) අම්මා, පොළෙන් (2) අම්මා, කඩයෙන් (3) තාත්තා, පොළෙන්

14. බෝනික්කාගේ ලක්ෂණ දෙකක් වන්නේ,

(1) ඇස් නැටවීම සහ අත් සෙලවීම ය.
(2) හිස සෙලවීම සහ ඇස් නැටවීම ය.
(3) නැටීම සහ හිස සෙලවීම ය.

[4 වැනි පිටුව බලන්න

15. මේ කවියෙන් වැඩිපුර ම කියවෙන්නේ කුමක් ගැන ද?

(1) බෝනික්කාගේ වටිනාකම පිළිබඳ ව ය.

(2) බෝනික්කා ලැබුණු ආකාරය පිළිබඳ ව ය.

(3) බෝනික්කාගේ ලස්සන පිළිබඳ ව ය.

16. "විසිපන්දහස් අටසිය විසි එක" යන සංඛ්‍යාවේ ඇති ඉලක්කම් අග සිට මුලට ලියූ විට ලැබෙන සංඛ්‍යාව කුමක් ද?


(1) 12 825 (2) 82 125 (3) 12 852

17. ඔරලෝසුවක පැය කටුවත් මිනිත්තු කටුවත් සෘජු කෝණයක් ඇතිව පිහිටන අවස්ථා දෙකක වේලාවල් දක්වෙන පිළිතුර කුමක් ද?

(1) 6.15 සහ 12.15 (2) 3.00 සහ 9.00 (3) 3.30 සහ 9.30

- හිස්තැන්වලට ගැළපෙන පිළිතුර තෝරන්න.

18.





(1) (2) (3)


19.


| | | | |
|---|---|---|---|
| 2 | 3 | 1 | 6 |
| 4 | ... | 3 | 24 |
| 2 | 3 | ... | 30 |
| 16 | 18 | 15 | |

(1) 5, 3 (2) 2, 5 (3) 3, 2

- නිවැරදි පිළිතුර තෝරන්න.


20. පහත රූපයෙන් දැක්වෙන්නේ කාඩ්බෝඩ්වලින් සැදූ පෙට්ටියකි. එය දිග හැරිය විට දැක්වෙන ආකාරය කුමක් ද?




(1) (2) (3)

21. මෙම රූපය නවා පෙට්ටියක් ලෙස සකස් කළ විට දැකිය හැකි ආකාරය කුමක් ද?





(1) (2) (3)

(5 වැනි පිටුව බලන්න


22. පුවත්පත, නවකථාව, ගීතය, ප්‍රතිමාව, කවිය, මල යන ඒවායින් **නොගැලපෙන** දෙය තෝරන්න.

(1) පුවත්පත (2) ගීතය (3) මල

23. සරත්ගේ පියාගේ පියාත්, සරත්ගේ මල්ලීත් අතර ඇති ඥාති සම්බන්ධය කුමක් ද?


(1) බාප්පා සහ පුතා (2) මාමා සහ බෑනා (3) සීයා සහ මුනුපුරා


24. රූපයේ A, B සහ C යන වෘත්ත එකිනෙකට සමාන ය. එහි අඳුරු කළ කොටසේ වර්ගඵලය වර්ග සෙන්ටිමීටර 10 කි. මුළු රූපයේ වර්ගඵලය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?






(1) වර්ග සෙන්ටිමීටර 60 ට අඩු ය.
(2) වර්ග සෙන්ටිමීටර 60 කි.
(3) වර්ග සෙන්ටිමීටර 60 ට වැඩි ය.

25. පහත රූපයේ දක්වා ඇති ආකාරයේ හැඩයක් AB රේඛාව දිගේ දෙකට නැමූවිට ලැබෙන රූපය කුමක් ද?





(1)


(2)


(3)

- 1, 2, 3 වෙනුවට පිළිවෙළින් ය, ළ, හ යන අකුරු යොදගෙන පහත සඳහන් ගණිතය කිරීම සිදුකරන ලදී. ඒ අනුව හිස්තැන්වලට සුදුසු අකුරු මොනවා ද?


26. ය + ළ = ......... (1) ය (2) හ (3) ළ

27. හ × ය = ......... (1) හ (2) ය (3) ළ

- පාසල් තුනකින්, උත්සවයකට පැමිණි ගුරුවරුන් සහ ළමයින් වෙනුවෙන් පහත සඳහන් ආකාරයේ පාටින් සහ හැඩයෙන් යුතු ලාංඡන ලබා දෙන ලදී.

විජය පාසල = නිල්, ගැමුණු පාසල = කොළ, ගජබා පාසල = රතු.
ගුරුවරු = වෘත්තය, පිරිමි ළමයි = ත්‍රිකෝණය, ගැහැනු ළමයි = සමචතුරස්‍රය.

28. විජය පාසලේ පිරිමි ළමයින්ට ලැබී තිබුණු ලාංඡනය කුමක් ද?




(1) (2) (3)

29. කොළ පාට වෘත්ත සහිත ලාංඡන ලැබී තිබුණේ කාට ද?


(1) විජය පාසලේ ගුරුවරුන්ට
(2) ගජබා පාසලේ පිරිමි ළමයින්ට
(3) ගැමුණු පාසලේ ගුරුවරුන්ට

[6 වැනි පිටුව බලන්න

30. අරුණ පාලිතට වඩා උස ය. චමරි අරුණට වඩා මිටි ය. මේ අනුව නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) පාලිතට වඩා චමරි උස ය.
(2) පාලිත හා චමරි දෙදෙනාගෙන් වඩාත් උස කවුදැයි කීම අසීරු ය.
(3) පාලිත හා චමරි එක සමාන උස ය.

31. මෙම රූපයට සම්බන්ධව නිවැරදි ප්‍රකාශය තෝරන්න.





(1) A කොටස රතු, නිල් හා කහ යන පාට තුනට ම අයත් ය.
(2) B හා C කොටස් කහ පාට ය.
(3) C කොටස නිල්පාට වන අතර D කොටස රතු පාට ය.

32. පහත ඇති ඉලක්කම් මත තීන්ත තවරා, එම ඉලක්කම් ඉදිරියෙන් මුද්‍රණය වන පරිදි තිත් ඉර දිගේ කඩදාසිය දෙකට නවා දිග හැරිය විට ලැබෙන සංඛ්‍යාව කුමක් ද?




(1) 801801
(2) 801108
(3) 108801

33. රූපයෙන් දක්වා ඇති දෙය ඝනකයක් වන සේ සම්පූර්ණ කිරීම සඳහා තවත් කුඩා ඝනක කීයක් අවශ්‍යවේ ද?



(1) 27 කි.
(2) 25 කි.
(3) 17 කි.


34. පහත කවියෙහි පද හතර මාරුකර ලියා ඇත. එය වඩාත් අර්ථවත් අනුපිළිවෙළක් ඇතිව සකස් කළහොත් ලැබෙන පිළිතුර කුමක් ද?

A. මිදුලෙ වතුරෙ උඩ පැන පැන - අපි සතුටින් නැටුවා
B. අහස අඳුරු කෙරුවා - සැඩ සුළඟක් හැමුවා
C. තද වැස්සක් වැස්සා - වතුර ගොඩක් ගැලුවා
D. හුංඩි අපට බය කර කර - විදුලි අකුණු කෙටුවා

(1) B D C A
(2) D C B A
(3) B C A D

[7 වැනි පිටුව බලන්න

- පහත දක්වා ඇත්තේ එක් කොටුවක පැත්තක දිග මීටර් 10 ක් වන සේ අඳින ලද, මාර්ග ජාලයකි.




**35.** ඉහත මාර්ග ජාලය තුළ කමලා A සිට D හරහා B වෙත ද සමන් B සිට C හරහා A වෙත ද ගමන් කරන ලදී. ඒ අනුව,

(1) කමලා සහ සමන් එක ම දුරක් ගමන් කර ඇත.

(2) සමන් කමලාට වඩා වැඩි දුරක් ගමන් කර ඇත.

(3) දෙදෙනා ම ගමන් කර ඇති මුළු දුර මීටර 220 කි.

**36.** ඉහත මාර්ග ජාලයේ A සිට C හරහා E දක්වා ඇති දුර,

(1) මීටර 50 කි. (2) මීටර 90 කි. (3) මීටර 100 කි.

**37.** පහත ඇති ඡායාරූපය නිරීක්ෂණය කරන්න. එම ඡායාරූපය ගෙන ඇත්තේ දවසේ කුමන වේලාවකදැයි දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.



(1) පෙ.ව. 6.00 ට පමණ

(2) පෙ.ව. 10.00 ට පමණ

(3) මධ්‍යාහ්න 12.00 ට පමණ

**38.** විද්‍යාලයීය ළමා චිත්‍ර හා අත්කම් ප්‍රදර්ශනයක් සිකුරාද දවසක ආරම්භ කරන ලදී. එය දින 8ක් පුරා පැවැත්වුණි නම් අවසන් වූ දවස කුමක් ද?

(1) සෙනසුරාදා (2) සිකුරාදා (3) බ්‍රහස්පතින්දා

**39.** පැය තුනකට වරක් නාදවන ඔරලෝසුවක් තිබේ. එය පෙ.ව. 07.00 ට නාද විය. ඊළඟට නාදවන අවස්ථා දෙක දක්වන්න.

(1) පෙ.ව. 10.00 සහ ප.ව. 01.00

(2) පෙ.ව. 11.00 සහ ප.ව. 01.00

(3) පෙ.ව. 10.00 සහ ප.ව. 02.00

**40.** එක් ස්ථානයක සිට ගමන් ආරම්භ කළ ළමයෙක්, මීටර 20ක් දකුණට ද එතැන් සිට මීටර 10ක් නැගෙනහිරට ද නැවත මීටර 15ක් උතුරට ද ගමන් කොට එතැනින් බටහිරට මීටර 10ක් ගොස් ගමන නිමා කළේ ය. ළමයා දැන් සිටින්නේ මුල් ස්ථානයේ සිට කොපමණ දුරකින් ද?

(1) මීටර 15 (2) මීටර 10 (3) මීටර 5

* * *

... ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව - සියලු ම හිමිකම් ඇවිරිණි]
... பதிப்புரிமையுடையது]
[All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2013

පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2013 අගෝස්තු

# II පත්‍රය

පැය 1 යි මිනිත්තු 15 යි.

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.)
- පිළිතුරු ලියන්නට දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු **තිත් ඉර මත** ලියන්න.
- පිළිතුරට යටින් ඉරක් අඳින්න කියා ඇති විට **ඉරක් පමණක් අඳින්න.**
- පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කේත අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමු පරීක්ෂක<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි | V/II/S |
| දෙවන පරීක්ෂක<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි | V/II/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක<br>ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි | V/II/S/EMF |
| ප්‍රධාන පරීක්ෂක<br>අධීක්ෂණය කළෙමි<br>අවසාන ලකුණ නිවැරදිය | V/II/S/CH |

[2 වැනි පිටුව බලන්න.

**පහත දැක්වෙන ඡේදය හොඳින් කියවන්න.**

ශාලාවට ඇතුළු වී අසුන් ගෙන වටපිට බැලූ ඔවුනට ග්‍රහලෝකාගාරයේ වහල පෙනුණේ විශාල නැඹිලියක් මුනින් නැවුවාක් මෙනි. මිහිරි සංගීත රාවය සමග අභ්‍යවකාශ තොරතුරු ද ඇසෙන්නට පටන්ගත්තේ ය. ශාලාව අඳුරු විය. ශබ්ද විකාශන යන්ත්‍රයෙන් විස්තර වන දේ අහසෙහි පෙනෙන්නට විය. පරිසරය විෂයයේදී අහස ගැන ඉගෙන ගන්නා දෑ මෙහි දී සියැසින් දකින විට ඇතැම් කරුණු සිසුන්ගේ සිතෙහි තදින් කාවැදිණි.

**ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරා ගෙන, තිත් ඉරි මත ලියන්න.**

(i) ඡේදයෙන් කියවෙන්නේ කුමක් පිළිබඳ ව ද?

:..............................................................

(ii) 'පොළොවෙහි' යන පදයට විරුද්ධාර්ථය දෙන පදය ඡේදයෙන් ම සොයා ලියන්න.

:..............................................................

(iii) පරිසරය විෂයයේදී අහස ගැන ඉගෙන ගත් දෙය තදින් සිතට කාවැදුණේ කුමක් නිසා ද?

:..............................................................

(iv) 'ආරම්භවිය.' යන්නට සමාන අර්ථය ඇති පදය ඡේදයෙන් ම සොයා ලියන්න.

:..............................................................

(v) 'දීර්ඝ ඇදය' යෙදී ඇති අකුරක් ඡේදයෙන් උපුටාගෙන ලියන්න :..............................

(vi) ඡේදයේ සඳහන් 'උපමාව' ලියන්න. :..............................................................

..............................................................................................

(අ) පහත දී ඇති හිස්තැන්වලට ගැළපෙන වචනය වරහන තුළින් තෝරා ගෙන **යටින් ඉරක් අඳින්න.**

(i) බුලත්අතට බුලත් කොළ .................. (හතළිහක් / හතලිහක්) ඇත.

(ii) (පිපුණු / පිපුනු).................. මල් මත වසනවා - මිහිරි ගී නද නගනවා.

(iii) මගේ මල්ලිට .............. (සඤ්ඤක / සඤ්ඥක) අකුරු හොඳින් කියවිය හැකි ය.

(ආ) පහත සඳහන් වගන්ති හරිනම් ( √ ) ලකුණ ද වැරදි නම් ( x ) ලකුණ ද **වරහන් තුළ** යොදන්න.

(i) 'සහෝදරයෝ' යන්න ප්‍රාණවාචී ඒකවචන නාම පදයකි. (.........)

(ii) 'සිටියෝ ය.' යන්න අතීතකාල බහුවචන ක්‍රියා පදයකි. (.........)

3. පහත සඳහන් **ඉංග්‍රීසි වාක්‍යවල අර්ථ සිංහලෙන්** ලියන්න.

(i) Don't shout please :..............................................................

(ii) I want to watch a match :..............................................................

[3 වැනි පිටුව බලන්න.

විභාග අංකය ..............................

4. පහත සඳහන් වාක්‍යයෙහි **අර්ථය ඉංග්‍රීසියට හරවා ඉංග්‍රීසි අකුරෙන් ම** ලියන්න.

අපි ක්‍රීඩාපිටියට යමු ද? : ..............................

5. පහත සඳහන් ඉංග්‍රීසි වචනවල අකුර බැගින් අඩු ය. අඩු අකුර හිස්තැනෙහි ලියන්න.

(i) cha _ k (ii) doct _ r

6. පහත සඳහන් වාග්විධිය දෙමළෙන් කියන ආකාරය **සිංහල අකුරෙන් ලියන්න.**

ඉක්මනින් දුවන්න : ..............................

7. පහත සඳහන් වාක්‍යයේ අර්ථය **සිංහලෙන් ලියන්න.**

එනක්කු ඉන්ද පාඩයෙයි සොල්ලිත් තාරුංගල් : ..............................

..............................

8. හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා ගෙන **යටින් ඉරක් අඳින්න.**

(i) දැනට භාවිත කෙරෙන සිංහල හෝඩියේ, අකුරු ..............ක් ඇත. (26 , 58 , 60)

(ii) මුද්දරයේ නිර්මාතෘ ලෙස හැඳින්වෙන්නේ ..............................ය.

(රෝලන්ඩ් හිල්, ජෝන් ලොගි බෙයාර්ඩ්, වික්ටෝරියා රැජින)

(iii) කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුරය ඉතා පැරණි කාලයේ හඳුන්වනු ලැබුවේ .............. නමිනි.

(පණ්ඩු ගම, සාගර ගම, දාරු ගම)

- ප්‍රශ්න අංක 9 සිට 11 තෙක් ප්‍රශ්නවල **හිස්තැන්** සම්පූර්ණ කරන්න.

9.
ඉවු කොට කළ ප්‍රඥ ප්‍රඥකම්
ලැබුණත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම්

මේ කවියේ හතරවැනි පදය තිත් ඉර මත ලියන්න.

..............................

10.
මවුපියෝ උතුම් මය
අපගෙ පෙර දෙවිවරු මය
අප රකිනුවෝ මය
වඳිමු මවුපිය දෙදෙන මහිමය

ඉහත කවියේ සඳහන් වන පරිදි, අපගෙ පෙර දෙවිවරු නම් ..............................ය.

11. "මා බාලේ ඇති කළ තලගොයි පැටියා" මේ කවියේ දෙවැනි පදය තිත් ඉර මත ලියන්න.

..............................

12. පහත සඳහන් වාක්‍යවල **තද කළු අකුරෙන්** ඇති වචනවල අර්ථය, තිත් ඉරි මත ලියන්න.

(i) මින්නේරිය අබය **වාපි** තෝපා ගිරිතලේ සිරිය : ..............................

(ii) විශිෂ්ට ජාතික ඇස්. මහින්ද හිමියෝ නිදහසේ මන්ත්‍රය, නිදහසේ දැහැන, ලංකා ගීතා ආදි පොත්වලින් **දේශාභිමානය** ඇති කිරීමට මහන්සි වූහ: ..............................

..............................

(iii) **තීක්ෂණ බුද්ධිය** මෙහෙයවා ගැටලු විසඳා ගත හැකි ය: ..............................

[4 වැනි පිටුව බලන්න.]

- ප්‍රශ්න අංක **13** සිට **15** තෙක් එක් එක් **හිස්තැනට** සුදුසු වචනය වරහන තුළින් තෝරා එට යටින් ඉරක් අඳින්න.

13. මවුහු පැටවුන්ට ආහාර .............. (දෙයි / දෙති).

14. ගංගා ලිය ගලා ............ (බසිති / බසියි).

15. පැරණි කාලයේ විසූ රජවරුන්ගෙන් ඇතැම් අය වැව් බැඳීමට උත්සාහ......... (කළේ ය / කළෝ ය).

16. රටක් ලස්සන වන්නේ එරට ඇති ස්වාභාවික පරිසරය හා මිනිසුන්ගේ යහපත් ක්‍රියාකාරකම් අනුව ය. මිනිසුන් යහපත් වන විට රටේ කීර්තිය ද ලොව දසත පැතිරේ. යහපත් මිනියකු තුළ තිබිය යුතු හොඳ පුරුදු යන මාතෘකාව පිළිබඳ ව වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට වැඩි විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.)

- .......................................................................................................
.......................................................................................................
- .......................................................................................................
.......................................................................................................
- .......................................................................................................
.......................................................................................................

- **දී ඇති හිස්තැන් මත පිළිතුරු සපයන්න.**

17. දී ඇති සංඛ්‍යාව අකුරෙන් ලියන්න. : 40039 :- .......................................................


18. අකුරෙන් දී ඇති සංඛ්‍යා රෝම ඉලක්කම්වලින් දක්වන්න.
(i) පහ:- .........., (ii) නවය:- ..........

19. ඊළඟට එන සංඛ්‍යා දී ඇති හිස්තැන් මත ලියන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 4 | 7 | 8 | 14 | 12 | 21 | ...... | ...... |

20. ගුණ කිරීම "*" සලකුණෙන් ද බෙදීම "#" සලකුණෙන් ද නිරූපණය වේ නම් මෙහි අගය ලියන්න.
72 # 9 * 8 = ..............................

21. පහත සඳහන් වන භාග එකතු කරන්න. $\frac{2}{3} + \frac{1}{4} =$ ..............................

22.

රූපයේ අඳුරු කර ඇති කොටස, භාගයක් ලෙස ලියන්න.:- ....................

23. $7\frac{8}{10}$ සහ $\frac{25}{100}$ දශම සංඛ්‍යා ලෙස ලියන්න. $7\frac{8}{10} =$ .................. $\frac{25}{100} =$ ..................

[5 වැනි පිටුව බලන්න.

- පහත දී ඇති සංඛ්‍යා උදව් කරගෙන ප්‍රශ්න අංක 24 ට පිළිතුරු සපයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 32 | | 27 | 41 | | 45 |
| | 21 | 60 | | 28 | |
| 35 | 36 | 42 | 22 | | 18 |

**24.** ඉහත සඳහන් සංඛ්‍යා උපයෝගී කරගෙන, **9** හි ගුණාකාර වගුව අනුපිළිවෙළින් සම්පූර්ණ කරන්න.

| 9 හි ගුණාකාරය |
|---|
| |
| |
| |
| |

**25.** දුම්රිය ස්ථානයට පැය 14:20 ට පැමිණීමට නියමිත දුම්රිය මිනිත්තු 45ක් ප්‍රමාද වන බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව, දුම්රිය පැමිණෙන වේලාව කීය ද?

පැය :-.............................

**26.** පහත සඳහන් වන්නේ නිමල් විසින් මිල දී ගන්නා ලද බඩු ලැයිස්තුවකි.

(අ) කිලෝ ග්‍රෑම් එකක් රුපියල් 65.00 බැගින් සහල් කිලෝ ග්‍රෑම් පහයි.

(ආ) කිලෝ ග්‍රෑම් එකක් රුපියල් 475.00 බැගින් තේකුඩු ග්‍රෑම් දෙසීයයි.

(ඉ) එකක මිල රුපියල් 397.00 බැගින් කිරිපිටි පැකට් තුනයි.

(ඊ) ලීටර එකක් රුපියල් 220.00 බැගින් පොල්තෙල් ලීටර දෙකයි මිලිලීටර පන්සියයයි.

(i) ඉහත දත්ත අනුව ද්‍රව්‍ය සඳහා ගෙවූ මුදල හිස්තැන්වල සටහන් කරන්න.

| ද්‍රව්‍ය | ගෙවන ලද මුදල | |
|---|---|---|
| | රුපියල් | ශත |
| (අ) සහල් | 325 | 00 |
| (ආ) තේකුඩු | ............... | ............ |
| (ඉ) කිරිපිටි | ............... | ............ |
| (ඊ) පොල්තෙල් | 550 | 00 |

(ii) ද්‍රව්‍ය සියල්ල ම සඳහා ගෙවන ලද මුළු මුදල කීය ද? රුපියල් :............ශත :............

**27.**





මෙහි **A** සිට **B** දක්වා දිග මිලිමීටරවලින් දක්වන්න.

මිලිමීටර:-.............................

[6 වැනි පිටුව බලන්න.

28. පහත සඳහන් කොටු ජාලය තුළ අඳුරු කර ඇති කොටසේ වර්ගඵලය කොටු කීයකට සමාන දී




කොටු:..................

29. බඳුනක ලීටර 2 යි මිලිලීටර 375 ක සිසිල්බීම ඇත. එම සිසිල්බීම ප්‍රමාණය සමාන බෝතල් පස
පුරවන ලදී.

මිලිලීටර:- ..........

එක් බෝතලයක ඇති සිසිල්බීම ප්‍රමාණය කොපමණ ද?

30.




(i) මෙම රූපයේ ඇති හැඩය සමචතුරස්‍රයක් කිරීම සඳහා එහි ප
පැත්තට තව සෙන්ටිමීටර කීයක් එකතුකළ යුතු ද?:-..........

(ii) සකස්කළ සමචතුරස්‍රයේ වර්ගඵලය, මුලින් තිබූ හැඩයේ වර්ගඵලය මෙන් කීගුණයක් ද?

..........

- ප්‍රශ්න අංක **31** සිට **60** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝ
**යටින් ඉරක් අඳින්න.**

31. බීජ සහ අතු මගින් පැලවෙන ශාකයක් වන්නේ,
(1) කරවිල ය. (2) නිවිති ය. (3) තක්කාලි ය. (4) පතෝල ය.


32. සුළඟ මගින් පැතිරී බෝවන ශාකයක් වන්නේ,
(1) කජු ය. (2) ජෝක්ක ය (3) පේර ය. (4) වරා ය.


33. ශ්‍රී ලංකාවේ ඒකදේශීය සතකු වන්නේ,
(1) කැහිබෙල්ලා ය. (2) ගිරවා ය. (3) කොහා ය. (4) කොකා ය.


34. රාත්‍රී කාලයේ හැසිරෙන සතකු වන්නේ,
(1) ගේකුරුල්ලා ය. (2) සැළලිහිණියා ය. (3) කපුටා ය. (4) ගොළුබෙල්ල

35. හොඳින් මේරූ බීජයක් හඳුනාගත හැකි, ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) ජල භාජනයකට දමන බීජ පතුලට බැසීම
(2) බීජයේ තැනින් තැන පුල්ලි සහිත වීම
(3) බීජයේ වර්ණය තද පැහැ නොගැනීම
(4) බීජය සැහැල්ලුවෙන් පොඩි කළ හැකි වීම

36. වඩු කර්මාන්තයේ දී යොදා ගනු ලබන උපකරණයකි.


(1)


(2)


(3)


(4)


[7 වැනි පිටුව බලන්න.

37. පහත සඳහන් රූපයේ දැක්වෙන ශාකය කුමක් ද?



(1) ගොයම්
(2) රතුඑළු
(3) නිරමුල්ලිය
(4) සැවැන්දරා

38. මෙම මැහුම් ක්‍රමය හඳුන්වන්නේ,



(1) දම්වැල් මැස්ම නමිනි. (2) කතිර මැස්ම නමිනි.
(3) බ්ලැන්කට් මැස්ම නමිනි. (4) නැට් මැස්ම නමිනි.

39. මහා මාර්ගයේ ඇති විදුලි සංඥා පුවරුවක රතු පාට එළිය දැල්වීමෙන් සංඥා කෙරෙන්නේ,

(1) රථය ධාවනය කරන්න යන්නයි. (2) රථය නවත්වන්න යන්නයි.
(3) රථය ධාවනයට සූදානම්වන්න යන්නයි. (4) රථය දකුණට හරවන්න යන්නයි.

40. මස් මාංස පමණක් ආහාරයට ගන්නා සතෙකි.
(1) බල්ලා (2) පූසා (3) හුනා (4) සිංහයා

41. මඤ්ඤොක්කා අලවල වඩාත් බහුලව අඩංගු පෝෂ්‍ය පදාර්ථය වන්නේ,
(1) විටමින් ය. (2) කාබෝහයිඩ්‍රේට් ය.(3) ලවණ ය. (4) ප්‍රෝටීන් ය.

42. ඓතිහාසික වටිනාකමකින් යුත් පූජනීය නගරයකි.
(1) අනුරාධපුරය (2) නුවරඑළිය (3) සීගිරිය (4) වවුනියාව

43. ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටි රටක් වන්නේ,
(1) සෞදි අරාබියයි. (2) ජපානයයි. (3) ඉන්දියාවයි. (4) කැනඩාවයි.

44. ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපොළ පිහිටා ඇත්තේ,
(1) කටුනායක ය. (2) මත්තල ය. (3) රත්මලානේ ය. (4) වීරවිල ය.

45. ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලනය සහිත ව කිරි නිෂ්පාදනය කරන කර්මාන්තශාලාවක් පිහිටි ප්‍රදේශය වන්නේ,
(1) වැලිසර ය. (2) මහඉලුප්පල්ලම ය. (3) හංවැල්ල ය. (4) අඹේවෙල ය.

46. සූර්යාට ළඟින් ම පිහිටා ඇති ග්‍රහ වස්තුව නම්,
(1) පෘථිවියයි. (2) සිකුරුයි. (3) බුධයි. (4) අඟහරුයි.

47. ශ්‍රී ලංකා සිතියමක අභය භූමි සලකුණු කර ඇත්තේ කිනම් වර්ණයකින් ද?
(1) කළු (2) කොළ (3) රතු (4) නිල්

48. පරිසර හිතකාමී කෘමිනාශකයක් සකස් කර ගැනීම සඳහා වඩාත් යෝග්‍ය වූ බීජ වර්ගයකි.
(1) ගස්ලබු ඇට (2) කොහොඹ ඇට (3) එඬරු ඇට (4) දඹල ඇට

49. පාචනය රෝගය ඇති කරන්නේ,
(1) ගෙමැස්සා ය. (2) මකුළුවා ය. (3) මදුරුවා ය. (4) කුරුමිණියා ය.

50. දේවානම්පිය තිස්ස රජතුමා විසින් තනවන ලද්දේ,
(1) තිසා වැවයි. (2) යෝධ වැවයි.
(3) කන්තලේ වැවයි. (4) මහකනදරා වැවයි.

[8 වැනි පිටුව බලන්න.

51. පුර පිළිස්සීමකදී භාවිත කෙරෙන ඖෂධීය ශාකයකි.
(1) රණවරා (2) පාවට්ටා (3) හාතාවාරිය (4) කෝමාරිකා

52. කොලාජ් නිර්මාණයක් යනු,
(1) දිය සායම් යොද ගනිමින් කරනු ලබන නිර්මාණයකි.
(2) රේඛා මගින් අඳිනු ලබන නිර්මාණයකි.
(3) පැස්ටල් භාවිත කරමින් කරනු ලබන නිර්මාණයකි.
(4) කඩදාසි කැබලි ඉරා අලවා කරනු ලබන නිර්මාණයකි.

53. නිල් සහ රතු වර්ණ මිශ්‍ර කිරීමෙන් සෑදෙන වර්ණය වන්නේ,
(1) කළු ය. (2) සුදු ය. (3) දුඹුරු ය. (4) දම් ය.

54. අකුණු ගහන අවස්ථාවක ආරක්ෂාවීමට වඩාත් ම සුදුසු ක්‍රමය වන්නේ,
(1) ගසක් යටට වී සිටීම ය. (2) ජලාශයකට බැස සිටීම ය.
(3) ගෙතුළ ඇඳක් මත සිටීම ය. (4) තැනිතලා බිමක ඇවිදීම ය.

55. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනයේ දක්නට ලැබෙන සංකේතයක් වන්නේ,
(1) බෝපත් ය. (2) හංසයා ය. (3) ඉර ය. (4) නාගයා ය.

56. ජල පිල්ටරයක් සකස් කිරීම සඳහා යොද ගනු ලබන උපකරණ කාණ්ඩය තෝරන්න.
(1) ලොකු ප්ලාස්ටික් බෝතලයක්, පුළුන් ගුලියක්, බොරළු තට්ටුවක්, වැලි තට්ටුවක්
(2) ලොකු ප්ලාස්ටික් බෝතලයක්, බොරළු තට්ටුවක්, ගඩොල් කැට කිහිපයක්, වැලි තට්ටුවක්
(3) ලොකු ප්ලාස්ටික් බෝතලයක්, පුළුන් ගුලියක්, ගඩොල් කැට කිහිපයක්, මැටි ස්වල්පයක්
(4) ලොකු ප්ලාස්ටික් බෝතලයක්, බොරළු තට්ටුවක්, ගඩොල් කැට කිහිපයක්, මැටි ස්වල්පයක්

57. කාන්දමක් ළං කළ විට ඇදී එන්නේ පහත සඳහන් කිනම් ද්‍රව්‍යය ද?
(1) පිත්තල (2) ඇලුමිනියම් (3) යකඩ (4) රිදී

58. උසකින් වැටී ඉළඇට බිඳීමකට පත් වූ පුද්ගලයකු සඳහා වහා ම කළ යුතු ප්‍රථමාධාරය වන්නේ,
(1) ශරීරයේ අනතුරට ලක් වූ ස්ථානය රෙදි පටියකින් බැඳීම ය.
(2) ශරීරයේ අනතුරට ලක් වූ ස්ථානය පිරිසිදු ජලයෙන් සේදීම ය.
(3) පුද්ගලයා නොසෙල්වෙන සේ සමතලා ස්ථානයක තැබීම ය.
(4) උණු පානයක් ලබාදීම ය.

59. ශ්‍රී ලංකාවේ ආරම්භ වූ පළමු අධිවේගී මහා මාර්ගය කුමක් ද?
(1) උතුරු අධිවේගී මහා මාර්ගය (2) දක්ෂිණ අධිවේගී මහා මාර්ගය
(3) කටුනායක අධිවේගී මහා මාර්ගය (4) කොළඹ-නුවර අධිවේගී මහා මාර්ගය

60. සාමූහික ක්‍රීඩාවල දී, **නොතිබිය** යුතු ගුණාංගය මින් කුමක් ද?
(1) නායකත්වයට ගරු කිරීම
(2) තම කාර්ය වගකීමෙන් ඉටු කිරීම
(3) තමාට කැමති ලෙසින් කටයුතු කිරීම
(4) ජය පරාජය පිළිගැනීම

***